සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**11 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

| | | |
|---|---|---|
| බුද්ධ ධර්මය | I, II | පැය තුනයි |
| பௌத்தம் | I, II | மூன்று மணித்தியாலம் |
| Buddhism | I, II | Three hours |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## බුද්ධ ධර්මය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. සිදුහත් බෝසතාණෝ තමා අත්විඳින කාමභෝගී ලෞකික ජීවිතය සැබෑ යථාර්ථය නොවන බව, පළමුවරට පසක් කර ගත්තේ,
   (1) නළු නිළියන්ගේ විප්‍රකාර දැකීමෙනි. (2) අතරමගදී පැවිදි රුවක් දැකීමෙනි.
   (3) රාහුල කුමරු උපන් බව ඇසීමෙනි. (4) ජරා ව්‍යාධි මරණ අත්දැකීමට ලැබීමෙනි.

2. තථාගතයන් වහන්සේගේ ප්‍රථම උදානය අනුව, උන්වහන්සේට නොයෙක් ආත්මභාවවල ඉපිද ජරා මරණාදී දුක් දොම්නස්වලට මුහුණ දීමට සිදුවූයේ,
   (1) තෘෂ්ණාව නිසාය. (2) මානය නිසාය. (3) ද්වේශය නිසාය. (4) කර්ම විපාක නිසාය.

3. "රහසත් පව් නොකොට - කෙලෙසරයනුත් දුරුකොට" මෙම කවි දෙපදයෙන් කියැවෙන්නේ බුදුරජාණන් වහන්සේ සතුව පැවති කිනම් බුදු ගුණය ද?
   (1) අරහං (2) සම්මා සම්බුද්ධ (3) ලෝකවිදූ (4) භගවා

4. බුදුරජාණන් වහන්සේගේ සුගත යන බුදු ගුණයෙහි අර්ථය ප්‍රකාශ **නොවන** වරණය කුමක් ද?
   (1) 'ආර්ය මාර්ගයෙහි ගමන් කළ හෙයින්'
   (2) 'සුන්දර වූ නිවනට සැපත් වූ හෙයින්'
   (3) 'දෙලොවට වැඩ ඇති යහපත් වචන කථා කරන හෙයින්'
   (4) 'සියලු පූජාවන් පිළිගැනීමට සුදුසු වූ හෙයින්'

5. "මම සම්බුද්ධ වෙමි. ශ්‍රේෂ්ඨ ශල්‍ය වෛද්‍යවරයා ද වෙමි." බුදුරජාණන් වහන්සේගේ මෙම ප්‍රකාශයෙන් ප්‍රකට වන්නේ උන්වහන්සේ,
   (1) ගිලනුන්ට උපස්ථාන කිරීම ආදර්ශයෙන් ම පෙන්වූ බවයි.
   (2) මිනිස් සිතෙහි ඇති රාගාදී කෙලෙස් මුලිනුපුටා දමන බවයි.
   (3) වෙදකම මෙන්ම හෙදකම ද මනාව කරන බවයි.
   (4) ශල්‍යකර්ම කරන වෛද්‍යවරයකු බවයි.

6. සිදුහත් බෝසතාණන් වහන්සේ පාරමිතා පූරණය කළ ආකාරය ජාතක කතාවලින් ප්‍රකට වේ. ඒ අනුව උන්වහන්සේ පාරමිතාවක් පූරණය කිරීම හා එයට අදාළ ජාතක කතාව නිවැරදිව සඳහන් වන පිළිතුර තෝරන්න.
   (1) උපේක්ෂා පාරමිතාව - කපි ජාතකය
   (2) මෛත්‍රී පාරමිතාව - වට්ටක ජාතකය
   (3) නෙක්ඛම්ම පාරමිතාව - මඛාදේව ජාතකය
   (4) අධිෂ්ඨාන පාරමිතාව - ලෝමහංස ජාතකය

[දෙවැනි පිටුව බලන්න.

EXAMRESULTS.LK

**7.** හිදීම, සිටීම, ඇවිදීම ආදී සියලු ක්‍රියාවන්හි අවබෝධයෙන් යුතුවීම, සමථ භාවනාව වැඩීමේදී පැවතිය යුතු මූලික ගුණාංගයකි. එය හැඳින්වෙන්නේ,
(1) ඉන්ද්‍රිය සංවරය නමිනි. (2) සති සම්පජඤ්ඤ නමිනි.
(3) නිසම්මකාරී නමිනි. (4) බ්‍රහ්මචරිය නමිනි.

**8.** තමා උපමා කොට අනුන් ගැන සිතීමට හා කටයුතු කිරීමට උපදෙස් දෙන ධර්ම පර්යාය හඳුන්වන්නේ,
(1) අත්තූපනායික නමිනි. (2) අත්තජ්ඣාසය නමිනි.
(3) ධම්මාධිපති නමිනි. (4) ලෝකාධිපති නමිනි.

**9.** උට්ඨාන වීර්යයෙන්, දැත දෙපයේ මහන්සියෙන්, දහඩිය වගුරවා, ධාර්මිකව උපයාගත් ධනය නිවැරදි ආකාරයෙන් පරිහරණය කිරීම ධර්මයේ හැඳින්වෙන්නේ,
(1) අත්ථි සුඛ නමිනි. (2) භෝග සුඛ නමිනි.
(3) අනණ සුඛ නමිනි. (4) අනවජ්ජ සුඛ නමිනි.

**10.** "සත්ව පුද්ගල ද්‍රව්‍ය ආදී ඕනෑම ජීව අජීව පදාර්ථයක්ම ඇතිවීමේ හා නැතිවීමේ ස්වභාවයෙන් යුක්ත ය." යන ලක්ෂණය බුදුදහමේ හැඳින්වෙන්නේ,
(1) තතථා නමිනි. (2) විතතතා නමිනි.
(3) අනිත්‍යතා නමිනි. (4) විසමතා නමිනි.

**11.** සේව්‍යයා විසින් සේවකයාට ඉටු කළ යුතු යුතුකම් පහක් සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන අතර එම යුතුකම්වලට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) ශක්ති ප්‍රමාණයට වැඩ පැවරීම ය. (2) සුදුසු පරිදි ආහාර හා වැටුප් ලබාදීම ය.
(3) සෞඛ්‍ය පහසුකම් සපයා දීම ය. (4) අවමන් නොකිරීම ය.

**12.** කෝපය, වෛරය, ද්වේෂය, ක්‍රෝධය යන නම්වලින් හැඳින්වෙන නීවරණ ධර්මය කුමක් ද?
(1) කාමච්ඡන්දය (2) ව්‍යාපාදය (3) ථීනමිද්ධය (4) විචිකිච්ඡාව

**13.** අනුලෝම පටිච්ච සමුප්පාද ඉගැන්වීමෙහි දැක්වෙන පරිදි "ප්‍රතිසන්ධි සිත හේතු කොටගෙන පංචස්කන්ධය ඇති වේ" යන්න ප්‍රකාශ වන්නේ,
(1) "අවිජ්ජා පච්චයා සංඛාරා" යන්නෙනි.
(2) "විඤ්ඤාණ පච්චයා නාමරූපං" යන්නෙනි.
(3) "නාමරූප පච්චයා සළායතනං" යන්නෙනි.
(4) "උපාදාන පච්චයා භවෝ" යන්නෙනි.

**14.** පුද්ගල විසමතා ඇතිවීමට හේතුව කර්මය බව පැහැදිලි කරමින් තෝදෙය්‍ය පුත්‍ර සුභ මානවකයාට දේශනා කළ සූත්‍රය කුමක් ද?
(1) පත්තකම්ම සූත්‍රය (2) චූල්ලකම්ම විභංග සූත්‍රය
(3) දක්ඛිණා විභංග සූත්‍රය (4) සච්ච විභංග සූත්‍රය

**15.** ජීවිත පුරුද්දක් ලෙස සිදු කරන කුසලාකුසල කර්ම හා කලින් කරන ලදුව නිරන්තරයෙන් සිහි කරන කුසලාකුසල කර්ම හැඳින්වෙන්නේ,
(1) ගරුක කර්ම නමිනි. (2) ආසන්න කර්ම නමිනි.
(3) ආචිණ්ණ කර්ම නමිනි. (4) කටත්තා කර්ම නමිනි.

**16.** ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන් කටයුතු කිරීමෙන් තමාට මුහුණ දීමට සිදුවන අකුසල කර්ම විපාක මගහරවා ගත හැකි බව ධර්මයේ සඳහන් වන්නේ,
(1) ගති සම්පත්තිය නමිනි. (2) උපධි සම්පත්තිය නමිනි.
(3) කාල සම්පත්තිය නමිනි. (4) පයෝග සම්පත්තිය නමිනි.

**17.** දස අකුසල් අතර මනෝ කම්ම ගණයට අයත් **නොවන** අකුසලය කුමක් ද?
(1) විචිකිච්ඡා (2) අභිධ්‍යා (3) ව්‍යාපාද (4) මිථ්‍යාදෘෂ්ටි

**18.** සත්වයා, පුද්ගලයා, මම, ආත්මය යනු සම්මුති වචන මාත්‍රයක් පමණක් බවත්, මේ සියල්ල වෙනස් වන බවත්, දුක් සහිත බවත්, ආත්ම නොවන බවත්, ප්‍රකට කෙරෙන්නේ,
(1) ත්‍රිලක්ෂණයෙනි. (2) ත්‍රි විද්‍යාවෙනි.
(3) පංච නියාමයෙනි. (4) ත්‍රි ශික්ෂාවෙනි.

**19.** "යම් ක්‍රියාවක් කිරීමෙන් පසුතැවෙන්නට සිදු වේද, විපාකය කඳුළු පිරි මුහුණින් යුතුව අඬමින් විඳින්නට සිදු වේද එබඳු ක්‍රියා නොකිරීම යහපත් ය." යන අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
- (1) "නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති" යන්නයි.
- (2) "තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති" යන්නයි.
- (3) "සුකරානි අසාධූනි - අත්තනො අහිතානිච" යන්නයි.
- (4) "අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මේ" යන්නයි.

**20.** බුදුරජාණන් වහන්සේ පංච බලි නම් යුතුකම් පහ කිනම් සූත්‍රයක දී කවරෙකුහට දේශනා කළේද?
- (1) පත්තකම්ම සූත්‍රයේ දී අනේපිඬු සිටුතුමාට
- (2) අනණ සූත්‍රයේ දී අනේපිඬු සිටුතුමාට
- (3) කූටදන්ත සූත්‍රයේ දී කූටදන්ත බමුණාට
- (4) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී දීඝජානු කෝලිය පුත්‍රයාට

**21.** පංච බලි සංකල්පයේ දැක්වෙන පරිදි තම නෑදැයින්ට යුතුකම් ඉටුකිරීම හැඳින්වෙන්නේ,

(1) ඥාති බලි යනුවෙනි. (2) අතිථි බලි යනුවෙනි.
(3) පුබ්බපේත බලි යනුවෙනි. (4) දේවතා බලි යනුවෙනි.

**22.** බුදුරජාණන් වහන්සේ කාලාම වැසියන්ට යමක් ඉඳුරාම නොපිළිගත යුතු යැයි දේශනා කළ කරුණු අතරට අයත් **නොවන්නේ**,
- (1) 'ආරංචි මාත්‍රයෙන්' යන්නයි.
- (2) 'පරම්පරාවෙන් පැවත එන නිසා' යන්නයි.
- (3) 'තර්කානුකූල නිසා' යන්නයි.
- (4) 'විවේචනය කළ නොහැකි නිසා' යන්නයි.

**23.** සමගියෙන් හා සතුටින් බැඳී, වාද විවාද නොකර, කිරි හා ජලය මෙන් එකට පෑහී, එකමුතුව, එකිනෙකා දෙස ප්‍රිය වූ ඇසින් බලමින් ජීවත්වීම බුදුදහමේ හැඳින්වෙන්නේ,

(1) සහකම්පනය ලෙස ය. (2) සහයෝගය ලෙස ය.
(3) සහජීවනය ලෙස ය. (4) සහානුභූතිය ලෙස ය.

**24.** ජාතික, ආගමික හා සංස්කෘතික වශයෙන් විවිධ වූ ජන සමාජයක ජීවත්වීමේදී, සමගියෙන් සමාදානයෙන් ජීවත්වීම සඳහා ඉවහල් වන බෞද්ධ ඉගැන්වීම් සඳහන් වන වරණය කුමක් ද?

(1) සිව් සස් හා සිව් සඟරාවත් (2) සිව් සඟරාවත් හා සිව් බඹ විහරණ
(3) සිව් පිළිසිඹියා හා සිව් බඹ විහරණ (4) සිව්පසය හා සිව්සස්

**25.** "සත්වයා යනු ස්කන්ධ සමූහයක එකතුවකි." යන ස්කන්ධ විභාගයට අනුව පඨවි ආදී සතර මහා භූත අයත් වන්නේ,

(1) රූප ස්කන්ධයට ය. (2) වේදනා ස්කන්ධයට ය.
(3) සඤ්ඤා ස්කන්ධයට ය. (4) සංඛාර ස්කන්ධයට ය.

**26.** නො පසුබස්නා වීර්යයෙන්, එළඹ සිටි සිහියෙන්, තිදොරින් පිරිසිදුව කටයුතු කරන, නුවණින් පිරික්සා ක්‍රියාකරන පුද්ගලයාගේ යසස වැඩෙන බව සඳහන් ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
- (1) "අචරිත්වා බ්‍රහ්ම චරියං - අලද්ධා යොබ්බනේ ධනං" යන්නයි.
- (2) "උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ" යන්නයි.
- (3) "අප්පමාදෝ අමතපදං - පමාදෝ මච්චුනෝපදං" යන්නයි.
- (4) "සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානිච" යන්නයි.

**27.** පටිච්ච සමුප්පාද න්‍යායට අනුව තෘෂ්ණාව හේතු කොට ගෙන සමාජය තුළ කලකෝලාහල මෙන්ම විවිධ ගැටුම් ඇතිවන ආකාරය විස්තර කෙරෙන සූත්‍ර දේශනාවකි,

(1) මහා සමය සූත්‍රය. (2) මහා පරිනිබ්බාන සූත්‍රය.
(3) මහා නිදාන සූත්‍රය. (4) මහාපදාන සූත්‍රය.

**28.** දස සක්විතිවත්වලට අයත් කරුණක් **නොවන්නේ**,
- (1) රට සුරකින බළ සෙනඟට රැකවරණය සැලසීම ය.
- (2) රටේ අධාර්මික ක්‍රියා ඇති නොවන ලෙස කටයුතු කිරීම ය.
- (3) දිළිඳු ජනයාට ධනය ලබාදීම ය.
- (4) කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම ය.

266655



**29.** වැපිරිය යුතු බීජයක් ලෙස ද හඳුන්වා ඇති, ත්‍රිවිධ රත්නයෙහි ගුණ මහිමය පිළිබඳ අප සිත් සතන් තුළ ඇති වන පැහැදීම හැඳින්වෙන්නේ,
(1) භක්තිය ලෙසිනි.
(2) ශ්‍රද්ධාව ලෙසිනි.
(3) සමාධිය ලෙසිනි.
(4) ප්‍රසාදය ලෙසිනි.

**30.** පංච නීවරණ ධර්මවල දැක්වෙන පරිදි පිත් රෝගයෙන් පෙළෙන්නෙකුට ආහාරයක කිසිදු රසයක් නොදැනෙන්නාක් මෙන්, හොඳ නරක කිසිවක් හඳුනාගත **නොහැක්කේ**,
(1) කාමච්ඡන්දය නිසා ය.
(2) ව්‍යාපාදය නිසා ය.
(3) ථීනමිද්ධය නිසා ය.
(4) විචිකිච්ඡාව නිසා ය.

**31.** සම්මා දිට්ඨිය පස් ආකාරයෙන් බෙදා දැක්වීමේදී, සියල්ල අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දැකීම හඳුන්වන්නේ,
(1) කම්මස්සකතා සම්මා දිට්ඨි වශයෙනි.
(2) ධ්‍යාන සම්මා දිට්ඨි වශයෙනි.
(3) විදර්ශනා සම්මා දිට්ඨි වශයෙනි.
(4) මාර්ග සම්මා දිට්ඨි වශයෙනි.

**32.** සියම් දේශයෙන් උපාලි හිමියන් ඇතුළු පිරිසක් වැඩම කරවාගෙන උපසම්පදා විනය කර්මය සිදු කිරීමෙන් පසු ලක්දිව නව ශාසනික පුනරුදයක් ආරම්භ වූයේ,
(1) කිත්සිරිමෙවන් රාජ්‍ය සමයේදී ය.
(2) විමලධර්මසූරිය රාජ්‍ය සමයේදී ය.
(3) කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයේදී ය.
(4) ශ්‍රී වික්‍රම රාජසිංහ රාජ්‍ය සමයේදී ය.

**33.** කථාවත්ථුප්පකරණය නමින් ග්‍රන්ථයක් සම්පාදනය කොට අභිධර්ම පිටකයට එක් කරනු ලැබුයේ,
(1) මහා කාශ්‍යප මහරහතන් වහන්සේ විසිනි.
(2) සබ්බකාමී මහරහතන් වහන්සේ විසිනි.
(3) සම්භූත මහරහතන් වහන්සේ විසිනි.
(4) මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේ විසිනි.

**34.** තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස නව රට සසුන් පිහිටුවීමේදී ඒ ඒ ප්‍රදේශවලට යොමු කරන ලද ධර්ම දූතයන් වහන්සේ හා උන්වහන්සේ වැඩම කළ ප්‍රදේශය නිවැරදිව සඳහන් වරණය තෝරන්න.
(1) මහාදේව හිමි - හිමවන්ත ප්‍රදේශය
(2) මජ්ඣිම හිමි - යෝනක රට්ඨය
(3) රක්ඛිත හිමි - වනවාසී දේශය
(4) මහා රක්ඛිත හිමි - අපරන්ත දේශය

**35.** අනුරාධපුර ථූපාරාමය හා කැළණි විහාර ස්තූපය ගොඩනංවා ඇත්තේ පිළිවෙළින් කිනම් ස්තූප ආකෘතීන්ට අනුව ද?
(1) බුබ්බුලාකාර - ඝණ්ටාකාර
(2) ධාන්‍යාකාර - බුබ්බුලාකාර
(3) ඝණ්ටාකාර - ධාන්‍යාකාර
(4) ඝණ්ටාකාර - ඝටාකාර

**36.** ස්තූපයක ගර්භය හා සම්බන්ධ සතර දිසාවට මුහුණ ලා සැකසූ තොරණ වැනි අංගය හඳුන්වන නම කුමක් ද?
(1) දේවතා කොටුව (2) කොරවක්ගල (3) වටදාගෙය (4) වාහල්කඩ

**37.** ලොව මවිතයට පත් කරන විවිධ කලා නිර්මාණවලින් අනූන පූජනීය ස්ථාන ආරක්ෂා කරගැනීම සඳහා ළමා අපගෙන් ඉටු විය යුතු වැදගත්ම යුතුකම වන්නේ,
(1) කලා නිර්මාණ සංචාරකයින්ට පෙන්වීමයි.
(2) කලා නිර්මාණ අගයමින් ප්‍රචාරණයක් ලබාදීමයි.
(3) පූජනීය ස්ථානවල සිටින ආරක්ෂක නිලධාරීන්ට සහාය වීමයි.
(4) කලා නිර්මාණවලට සිදුවිය හැකි හානි වළක්වා ගැනීමයි.

**38.** අනුරාධපුර මහමෙව්නා උයනේ පිහිටි සුප්‍රසිද්ධ සමාධි බුද්ධ ප්‍රතිමාවෙන් පිළිබිඹුවන මුද්‍රාව කුමක් ද?
(1) ධ්‍යාන මුද්‍රාව (2) අභය මුද්‍රාව (3) විතර්ක මුද්‍රාව (4) ධර්ම චක්‍ර මුද්‍රාව

**39.** කවර හේතුවක් නිසාවත් රටවැසියන් සමග කෝපයක් වෛරයක් ඇති කර නොගෙන සියලු රටවැසියන් තමාගේ දරුවන් ලෙස සලකා කටයුතු කිරීම දස රාජ ධර්මවල හැඳින්වෙන්නේ,
(1) මෘදු බව නමිනි. (2) තපස නමිනි. (3) අක්‍රෝධය නමිනි. (4) අවිරෝධතාව නමිනි.

**40.** දේශීය හා විදේශීය චිත්‍ර ශෛලීන්ගේ ලක්ෂණ උකහාගනිමින් කැළණි විහාරයේ අලුත් විහාර මන්දිරයේ චිත්‍ර අඳිනු ලැබූ ශිල්පියාගේ නම කුමක් ද?
(1) එම්. සාර්ලිස් මහතා
(2) සෝලියස් මෙන්දිස් මහතා
(3) ජෝර්ජ් කීට් මහතා
(4) සෝමබන්දු විද්‍යාපති මහතා

* *

[පස්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**11 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

බුද්ධ ධර්මය **I, II**
பௌத்தம் **I, II**
Buddhism **I, II**

## බුද්ධ ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) නාලාගිරි ඇතා දමනය කිරීමෙන් ප්‍රකට වන බුදු ගුණය කුමක් ද?
(ii) බුදුරජාණන් වහන්සේ පළමුවන හා දහවන වස්කාල ගතකළ ස්ථාන පිළිවෙළින් ලියා දක්වන්න.
(iii) කර්මස්ථාන ලබා දීමේ දී සැලකිල්ලට ලක්කරන පුද්ගල චරිත වර්ගීකරණයට අයත් චරිත **දෙකක්** ලියා දක්වන්න.
(iv) 'අනණ සුඛය' යන්නෙහි අර්ථය සැකෙවින් දක්වන්න.
(v) "ආරෝග්‍ය පරමා ලාභා - සන්තුට්ඨි පරමං ධනං" මෙම ගාථා පාඨයේ අර්ථය ලියන්න.
(vi) සිව් බඹ විහරණ නම් කරන්න.
(vii) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි පූජ්‍ය පක්ෂය විසින් ගිහි ජනතාවට ඉටු කළ යුතු යුතුකම් **දෙකක්** ලියන්න.
(viii) බුදු දහමේ දැක්වෙන සිව්වනක් පිරිස නම් කරන්න.
(ix) දිට්ඨධම්මවේදනීය කර්ම යන්නෙහි අර්ථය දක්වන්න.
(x) අභයගිරි හා ජේතවන ස්තූප ගොඩනැංවූ රජවරුන් දෙදෙනාගේ නම් පිළිවෙළින් ලියන්න.

**2.** (i) ආර්ය අෂ්ටාංගික මාර්ගයට අයත් මාර්ග අංග **දෙකක්** නම් කරන්න.
(ii) ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාව යටතේ බෙදා දක්වන්න.
(iii) ලෞකික ජීවිතයේ සාර්ථකත්වයට ආර්ය අෂ්ටාංගික මාර්ගය අදාළ කරගත හැකි ආකාරය පහදන්න.

**3.** (i) "අත්තනාව කතං පාපං" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.
(ii) එම ගාථාවේ තේරුම ලියන්න.
(iii) බුදු දහම හොඳ නරක ක්‍රියාවල වගකීම පුද්ගලයා වෙතම පවරා ඇති බව පැහැදිලි කරන්න.

**4.** (i) පරාභව සූත්‍රයේ දැක්වෙන පිරිහීමේ කරුණු **දෙකක්** ලියන්න.
(ii) මංගල සූත්‍රයේ දැක්වෙන මඟුල් කරුණු **තුනක්** සැකෙවින් දක්වන්න.
(iii) පුද්ගල ජීවිතයේ පරිහානිය වළක්වා ගනිමින් සාර්ථකත්වය ළඟාකර ගැනීම සඳහා මංගල සූත්‍රාගත කරුණු ඉවහල් කර ගත හැකි ආකාරය පහදන්න.

**5.** (i) බුද්ධ ප්‍රතිමාවල දක්නට ලැබෙන ආසන **දෙකක්** නම් කරන්න.
(ii) සඳකඩපහණ පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න.
(iii) ශ්‍රී ලාංකේය කලාකරුවාගේ කලා කෞශල්‍යය බුද්ධ ප්‍රතිමා කලාව ඇසුරෙන් පහදන්න.

[හයවැනි පිටුව බලන්න.

6. (i) පළමු ධර්ම සංගායනාවට තුඩුදුන් සුභද්‍ර භික්ෂුවගේ නොමනා ප්‍රකාශය ලියන්න.

(ii) එම සංගායනාව පැවැත් වූ ස්ථානය, මූලිකත්වය ගෙන ක්‍රියා කළ මහරහතන් වහන්සේ සහ අනුග්‍රහය ලබාදුන් රාජ්‍ය පාලකයා නම් කරන්න.

(iii) ධර්ම සංගායනාවන්හි ප්‍රධාන අරමුණ ශාසන සුරක්ෂිතතාව තහවුරු කිරීම බව පළමු සංගායනාව ඇසුරින් පහදන්න.

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

(i) දුටුගැමුණු මහරජතුමා

(ii) ත්‍රිලක්ෂණය

(iii) වීර්ය පාරමිතාව

(iv) මහනුවර යුගයේ චිත්‍ර කලාව

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
## க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2023 (2024)

විෂය අංකය / பாட இலக்கம்: **11**

විෂයය / பாடம்: **බුද්ධ ධර්මය**

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 4 | 21. | 1 | 31. | 3 |
| 02. | 1 | 12. | 2 | 22. | 4 | 32. | 3 |
| 03. | 1 | 13. | 2 | 23. | 3 | 33. | 4 |
| 04. | 4 | 14. | 2 | 24. | 2 | 34. | 3 |
| 05. | 2 | 15. | 3 | 25. | 1 | 35. | 3 |
| 06. | 3 | 16. | 4 | 26. | 2 | 36. | 4 |
| 07. | 2 | 17. | 1 | 27. | 3 | 37. | 4 |
| 08. | 1 | 18. | 1 | 28. | 4 | 38. | 1 |
| 09. | 2 | 19. | 1 | 29. | 2 | 39. | 3 |
| 10. | 3 | 20. | 1 | 30. | 2 | 40. | 2 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: $\frac{25}{40}$

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: $\frac{25}{40}$

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

# 11 - බුද්ධ ධර්මය

## II පත්‍රය

* පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

**1. (i) නාලාගිරි ඇතා දමනය කිරීමෙන් ප්‍රකට වන බුදු ගුණය කුමක් ද?**

පුරිසදම්ම සාරථී / පුරිසදම්ම සාරථී ගුණය / නොහික්මුණු පිරිස් දමනය කිරීම.

(ලකුණු 02යි)

**(ii) බුදුරජාණන් වහන්සේ පළමුවන හා දහවන වස්කාල ගතකළ ස්ථාන පිළිවෙළින් ලියා දක්වන්න.**

පළමුවන වස්කාලය:- බරණැස ඉසිපතන මිගදායේ දී / බරණැස ඉසිපතනයේ දී / ඉසිපතන මිගදායේ දී / ඉසිපතනයේ දී / මිගදායේ දී

දසවන වස්කාලය:- පාරිලෙය්‍ය වනයේ දී

**එක් කරුණකට ලකුණ බැගින් ලකුණු දෙක ලබා දෙන්න.**

(ලකුණු 02යි)

**(iii) කර්මස්ථාන ලබා දීමේ දී සැලකිල්ලට ලක්කරන පුද්ගල චරිත වර්ගීකරණයට අයත් චරිත දෙකක් ලියා දක්වන්න.**

1. රාග චරිත
2. දෝස චරිත / ද්වේශ චරිත
3. මෝහ චරිත
4. සද්ධා චරිත / ශ්‍රද්ධා චරිත
5. බුද්ධි චරිත
6. විතක්ක චරිත / විතර්ක චරිත

**එක් කරුණකට ලකුණ බැගින් ලකුණු දෙක ලබා දෙන්න.**

(ලකුණු 02යි)

**(iv) 'අනණ සුඛය' යන්නෙහි අර්ථය සැකෙවින් දක්වන්න.**

අනුන්ට ණය නැතිව විසීමෙන් ලැබෙන සැපය / ණය නොවී ජීවත්වීමේ සතුට / ණය නොවී සිටීම

(ලකුණු 02යි)

**(v) "ආරෝග්‍ය පරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං" මෙම ගාථා පාඨයේ අර්ථය ලියන්න.**

ලාභයන් අතරින් නිරෝගී බව උතුම් ය. ධන සම්පත් අතරින් සතුට ශ්‍රේෂ්ඨය. / නිරෝගීකම පරම ලාභය වේ. සතුට පරම ධනය වේ. / නිරෝගීකම උතුම් ලාභයයි. සතුට උතුම් ධනයයි.

(ලකුණු 02යි)

**(vi) සිව් බඹ විහරණ නම් කරන්න.**

1. මෙත්තා - මෛත්‍රිය
2. කරුණා - කරුණාව
3. මුදිතා - මුදිතාව හෙවත් අනුන්ගේ දියුණුවේදී සතුටුවීම
4. උපෙක්ඛා - උපේක්ෂාව/ මැදහත් බව

**කරුණු 2/3 ට ලකුණු එකයි. කරුණු 4 ට ලකුණු දෙකයි**
**(ලකුණු 02යි)**

**(vii) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි පූජ්‍ය පක්ෂය විසින් ගිහි ජනතාවට ඉටු කළ යුතු යුතුකම් දෙකක් ලියන්න.**

1. පවින් වැලැක්වීම
2. යහපතෙහි යෙදවීම
3. හොඳ සිතින්ම අනුකම්පා කිරීම
4. අසා නොමැති දහම් කරුණු කියාදීම
5. අසා ඇති දහම් කරුණු වඩාත් පැහැදිලි කර දීම.
6. සුගතියට මග පෙන්වීම

**පාලියෙන් ලියා තිබුණ ද ලකුණු දෙන්න.**
**එක් කරුණකට ලකුණ බැගින් ඕනෑම කරුණු දෙකකට ලකුණු දෙක දෙන්න.**
**(ලකුණු 02යි)**

**(viii) බුදු දහමේ දැක්වෙන සිව්වනක් පිරිස නම් කරන්න.**

1. භික්ඛු/ භික්ෂු
2. භික්ඛුණී/ භික්ෂුණී
3. උපාසක
4. උපාසිකා

**කරුණු 2/3 ට ලකුණු එකයි. කරුණු 4 ට ලකුණු දෙකයි.**

**(ලකුණු 02යි)**

**(ix) දිට්ඨධම්මවේදනීය කර්ම යන්නෙහි අර්ථය දක්වන්න.**

මෙලොවදී ම විපාක දෙන කුසලාකුසල කර්ම/ මේ ආත්ම භාවයේදීම විපාක ලැබෙන කර්ම/ මෙලොවදී විපාක ලැබෙන කර්ම / ප්‍රවෘර්ති විපාක ලැබෙන කර්ම

**(ලකුණු 02 යි)**

**(x) අභයගිරි හා ජේතවන ස්තූප ගොඩනැංවූ රජවරුන් දෙදෙනාගේ නම් පිළිවෙළින් ලියන්න.**

අභයගිරි ස්තූපය:- වලගම්බා / වට්ටගාමිණී අභය

ජේතවන ස්තූපය:- මහසෙන් / මහාසේන

**එක් කරුණකට ලකුණ බැගින් ලකුණු දෙක දෙන්න.**
**(ලකුණු 02යි)**

**2. (i) ආර්ය අෂ්ටාංගික මාර්ගයට අයත් මාර්ග අංග දෙකක් නම් කරන්න.**

1. සම්මා දිට්ඨි - නිවැරදි දැකීම
2. සම්මා සංකප්ප - නිවැරදි කල්පනාව
3. සම්මා වාචා - නිවැරදි වචන
4. සම්මා කම්මන්ත - නිවැරදි ක්‍රියා
5. සම්මා ආජීව - නිවැරදි ජීවිකාව
6. සම්මා වායාම - නිවැරදි උත්සාහය
7. සම්මා සති - නිවැරදි සිහිය
8. සම්මා සමාධි - නිවැරදි සමාධිය

**එක් කරුණක් නම් කිරීමට ලකුණු එකයි.**
**කරුණු 2 ක් නම් කිරීමට ලකුණු දෙක දෙන්න.**
**(ලකුණු 02 යි)**

**(ii) ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාව යටතේ බෙදා දක්වන්න.**

| | | |
|---|---|---|
| 1. සම්මා දිට්ඨි | - නිවැරදි දැකීම | ප්‍රඥා |
| 2. සම්මා සංකප්ප | - නිවැරදි කල්පනාව | |
| 3. සම්මා වාචා | - නිවැරදි වචන | ශීල |
| 4. සම්මා කම්මන්ත | - නිවැරදි ක්‍රියා | |
| 5. සම්මා ආජීව | - නිවැරදි ජීවිකාව | |
| 6. සම්මා වායාම | - නිවැරදි උත්සාහය | සමාධි |
| 7. සම්මා සති | - නිවැරදි සිහිය | |
| 8. සම්මා සමාධි | - නිවැරදි සමාධිය | |

**කොටස් තුනම නිවැරදිව බෙදා දක්වා තිබේනම් ලකුණු තුනක් දෙන්න.**
**එක් කොටසකට එක ලකුණ බැගින් ලකුණු තුනයි.**
**(ලකුණු 03යි)**

**(iii) ලෞකික ජීවිතයේ සාර්ථකත්වයට ආර්ය අෂ්ටාංගික මාර්ගය අදාළ කරගත හැකි ආකාරය පහදන්න.**

ලෞකික ජීවිතයේ සාර්ථකත්වය සඳහා ආර්ය අෂ්ටාංගික මාර්ගය බෙහෙවින් ම අදාළ කර ගත හැකිය.

- සම්මා දිට්ඨිය මගින් යහපත් ජීවන ගමනකට මග පාදයි. පිං පව්, හොඳ නරක තේරුම් ගෙන කටයුතු කිරීමට මග පාදයි.
- සම්මා සංකප්ප මගින් අභිජ්ඣා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටියෙන් තොර යහපත් සංකල්පනාවන් ගොඩ නගා ගෙන මෛත්‍රී සහගතව ලෞකික ජීවිතය සකස් කර ගත හැකිය.
- සම්මා වාචා තුළින් බොරු කීම, කේලම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කතා කිරීම ආදියෙන් තොර සමාජයට විශ්වාසවන්ත චරිතයක් ගොඩ නගා ගත හැකිය.

- සම්මා කම්මන්තයෙන් ප්‍රාණඝාත, අදත්තාදාන, කාම මිච්ඡාචාර, සුරා පාන ආදියෙන් තොර යහපත් පුද්ගල චරිතයක් ගොඩ නැගෙයි.
- සම්මා ආජීවය තුළින් ස්වකීය ලෞකික ජීවිතය සාධාරණ හා ධර්මානුකූල ආර්ථික තත්ත්වයක් ගොඩ නගා ගනී.
- සම්මා වායාම මගින් නිරතුරුවම පාපයෙන් මිදී කුසල් වැඩීමට උත්සාහ කරයි.
- සම්මා සතිය නිරතුරුවම අකුසල කර්මවලින් මිදී, සෑම අවස්ථාවකම මනා සිහියෙන් ක්‍රියා කිරීමට මඟ පෙන්වයි.
- සම්මා සමාධිය වැඩීමෙන් ජීවන අභියෝග මගින් කැළඹිල්ලකට පත් නොවී, උසස් මානසික මට්ටමක් පවත්වාගෙන යාමට හැකි වේ.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.**
**(ලකුණු 05 යි)**

**3. (i) "අත්තනාව කතං පාපං" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.**

අත්තනාව කතං පාපං
අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං
අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං
නාඤ්ඤමඤ්ඤෝ විසෝධයේ

**ගාථාව සම්පූර්ණයෙන් නිවැරදිව ලියා ඇත්නම් ලකුණු දෙක ප්‍රදානය කරන්න.**
**අක්ෂර වින්‍යාසය නොසලකන්න.**
**(ලකුණු 02 යි.)**

**(ii) එම ගාථාවේ තේරුම ලියන්න.**

තමා විසින් කරන ලද පවෙන් තමා අපිරිසිදු බවට පත්වේ. තමා විසින් නොකරන ලද පවෙන් තමා පිරිසිදු බවට පත්වේ. පිරිසිදු අපිරිසිදු බව තමා විසින්ම දත යුතුය. කෙනෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකිය.

**ගාථාවේ සම්පූර්ණ අදහස තිබේනම් ලකුණු තුනක් ලබා දෙන්න.**
**(ලකුණු 03 යි.)**

**(iii) බුදු දහම හොඳ නරක ක්‍රියාවල වගකීම පුද්ගලයා වෙතම පවරා ඇති බව පැහැදිලි කරන්න.**

- දේව නිර්මාණවාදය ඇතුලු සියලු ආකාරයේ නියතිවාදයන් බැහැර කරන බුදු දහම පුද්ගලයාගේ වගකීම පුද්ගලයා වෙතම පවරා ඇත.
- අධ්‍යාත්මික වශයෙන් පිරිසිදු බව හෝ අපිරිසිදු බව රඳා පවතින්නේ තමා තුළමය. එය අනෙකෙකුට ලබාදිය නොහැකිය.
- කිසියම් පුද්ගලයෙකුට මුහුණ පෑමට සිදුවන දුක් කම්කටොලු හෝ සැප සම්පත් සියල්ලටම හේතු වන්නේ තමා විසින් සිදු කරන ලද පාප කර්ම හෝ පුණ්‍ය කර්ම බව බුදු දහම අවධාරණය කරයි.

- හොඳ නරක ක්‍රියාවල වගකීම පුද්ගලයා වෙතම පවරා ඇති බව කාලාම සූත්‍රයෙන් ද පැහැදිලි වේ.

  "කාලාමයෙනි, මේ දහම් අකුසල් ය. මේ දහම් වරද සහිත ය. මේ දහම් නුවණැත්තන් විසින් ගරහන ලද්දේ ය. මේ දහම් සපුරා ගත්, සමාදම් කොට ගත් තැනැත්තාට අවැඩ පිණිසම, දුක් පිණිසම වන්නේ යැයි යම් කලෙක ඔබට ම වැටහේ නම් එකල්හි එය බැහැර කළ යුතුය." යනාදී වශයෙන් දක්වා ඇති පරිදි ආත්මාවබෝධය තුළින් හොඳ නරක ක්‍රියා විනිශ්චය කළ යුතු බව පැහැදිලි වේ.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.**

**(ලකුණු 05 යි.)**

**4. (i) පරාභව සූත්‍රයේ දැක්වෙන පිරිහීමේ කරුණු දෙකක් ලියන්න.**

- ධර්මයට අකමැතිවීම
- අසත්පුරුෂයන් ප්‍රියවීම
- සත්පුරුෂයින් ප්‍රිය නොකිරීම
- අසත්පුරුෂ ධර්මයට ප්‍රිය කිරීම
- නිතර නිදනසුලු බව (නිද්‍රාශීලීබව)
- නිශ්ඵල කථාවෙන්ම දවස ගෙවීම (සභාශීලී බව)
- උත්සාහයෙන් තොරවීම
- අලසකම
- ක්‍රෝධ කරන බව (කිපෙනසුලු බව)
- මහලුවියට පත් දෙමාපියන්ට නොසැලකීම
- මහණ බමුණන් බොරුවෙන් රවටීම
- රස බොජුන් තනිව වැළඳීම
- මානයෙන් උදම් වී ඥාතීන් පහත් කොට සැලකීම
- ස්ත්‍රීන් කෙරෙහි ලොල්වීම
- සුරාව කෙරෙහි ලොල්වීම
- සූදු කෙලියෙහි ලොල්වීම
- වෛශ්‍යාවන් සේවනය කිරීම
- පරඹුවන් කරා යාම
- වයසක පුද්ගලයකු ලාබාල තරුණියක සරණ පාවා ගැනීම
- නාස්තිකාර ස්ත්‍රියක හෝ පුරුෂයකු ගෘහ ආධිපත්‍යයෙහි තැබීම
- ධනයෙන් හීන, තෘෂ්ණාවෙන් යුතු ක්ෂත්‍රියයකු රජකම පැතීම

**මේ අතුරින් ඕනෑම කරුණු දෙකකට ලකුණු දෙක ලබා දෙන්න.**

**(ලකුණු 02 යි.)**

**(ii) මංගල සූත්‍රයේ දැක්වෙන මඟුල් කරුණු තුනක් සැකෙවින් දක්වන්න.**

- අනුවණයින් ඇසුරු නොකිරීම / බාලයන් ඇසුරු නොකිරීම.
- නුවණැත්තන් ඇසුරු කිරීම / පණ්ඩිතයන් ඇසුරු කිරීම.

- පිදිය යුත්තන් පිදීම
- සුදුසු පෙදෙසක විසීම
- පෙර කරන ලද පින් ඇති බව
- සීලාදී ගුණ ධර්මයන්හි පිහිටීම
- බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව / බහුශ්‍රැත බව
- ශිල්ප ශාස්ත්‍රයන්හි ප්‍රගුණ බව
- විනය ගරුක බව
- ප්‍රිය මනාප වචන කථා කිරීම
- මව්පියන්ට උපස්ථාන කිරීම
- අඹුදරුවන්ට සංග්‍රහ කිරීම
- නිවැරදි කාය කර්මයන්හි යෙදීම
- දන්දීම
- ධර්මානුකූලව හැසිරීම
- ඥාතීන්ට සංග්‍රහ කිරීම
- නිවැරදි ජීවන වෘත්තීන්හි යෙදීම
- පාපයෙහි නොඇලීම
- පවින් වැළකීම
- රහමෙර පානය නොකිරීම
- කුසල කර්මයන්හි අප්‍රමාදීවීම
- ගරු කළ යුත්තන්ට ගෞරව කිරීම
- යටහත් පැවතුම් ඇති බව
- ලද දෙයින් සතුටුවීම
- කළ ගුණ දන්නා බව
- සුදුසු කල්හි ධර්ම ශ්‍රවණය කිරීම
- ඉවසීම
- අවවාද පිළිගැනීම
- ශ්‍රමණයන් වහන්සේලා දැකීම
- සුදුසු කල්හි ධර්ම සාකච්ඡා කිරීම
- තපස
- බ්‍රහ්ම චර්යාව
- ආර්ය සත්‍ය දැකීම
- නිවන පසක් කිරීම
- අටලෝ දහම්හි කම්පා නොවීම
- සෝක රහිත බව
- කෙලෙස් නැති බව
- නිර්භයවීම

**ඕනෑම කරුණු තුනක් නම් කර ඇත්නම් ලකුණු තුනක් දෙන්න.**
**(ලකුණු 03 යි.)**

**(iii) පුද්ගල ජීවිතයේ පරිහානිය වලක්වා ගනිමින් සාර්ථකත්වය ලඟාකර ගැනීම සඳහා මංගල සූත්‍රාගත කරුණු ඉවහල් කර ගත හැකි ආකාරය පහදන්න.**

- පුද්ගල ජීවිතයේ පරිහානිය වලක්වා ගනිමින් සාර්ථකත්වය ලඟා කර ගැනීම සඳහා මංගල සූත්‍රාගත කරුණු ඉවහල් කරගත හැකිය. මංගල සූත්‍රයෙහි මඟුල් කරුණු 38 ක් ඉදිරිපත් කෙරේ. එම කරුණු මෙලොව හා පරලොව දියුණුව සඳහා ඉවහල් වන ආකාරයෙන් ඉදිරිපත් කොට ඇත.
- මංගල සූත්‍රයේ දැක්වෙන්නේ උපතේ සිට මරණය දක්වා මෙන්ම නිවන් අවබෝධය දක්වා ද අනුගමනය කළ යුතු කරුණු සමූහයකි. මෙම කරුණු එදිනෙදා ජීවිතයේ දී අනුගමනය කළ හැකි ප්‍රයෝගික කරුණු වේ.

- බාලයන් ඇසුරු නොකොට නුවණැත්තන් ඇසුරු කිරීම, පිදිය යුත්තන් පිදීම, දෙමාපියන්ට උපස්ථාන කිරීම, නිවැරදි කර්මාන්තයන්හි යෙදීම, රහමෙර පානයෙන් වැලකීම, ලද දෙයින් සතුටු වීම, ධර්මාණුකූලව දිවි ගෙවීම වැනි දෛනික ජීවිතය සාර්ථක කර ගැනීමට ඉවහල් වන කරුනු එහි ඇතුළත් වේ.

**මංගල කරුණු තුනක්වත් ආශ්‍රයෙන් ලියූ පිළිතුරකට සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.**
**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න. (ලකුණු 05 යි.)**

**5. (i) බුද්ධ ප්‍රතිමාවල දක්නට ලැබෙන ආසන දෙකක් නම් කරන්න.**

1. වීරාසනය
2. භද්‍රාසනය
3. පද්මාසනය

**එක කරුණකට එක් ලකුණ බැගින් ලකුණු දෙකක් දෙන්න.**

**(ii) සඳකඩපහණ පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න.**

- ශ්‍රී ලාංකේය කැටයම් ශිල්පියාගේ විස්මිත කලා කෞශල්‍යය ලොවට හෙළි කරන නිර්මාණයක් ලෙස සඳකඩපහණ අගය කළ හැකිය.
- බෞද්ධ සිද්ධස්ථානයකට හෝ රාජකීය ගොඩනැගිලිවලට පිවිසෙන පියගැට පෙළ ආරම්භයේ දක්නට ලැබෙන අර්ධ කවාකාර ගල් පුවරුව සඳකඩපහණ නමින් හැඳින්වේ.
- පාලි භාෂාවෙන් "අඩ්ඪචන්දපාසාණ" නමින් හැඳින් වේ.
- අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා, ඒ ඒ යුගවලට අනන්‍ය ලක්ෂණ ප්‍රකට කරමින් සඳකඩපහණ නිර්මාණය වී ඇත. අනුරාධපුර බිසෝ මාලිගය අසල ඇති සඳකඩපහණ වඩාත් කලාත්මක නිර්මාණය ලෙස සැලකේ.
- අනුරාධපුර යුගයට අයත් සඳකඩපහණින් භව චක්‍රය සංකේතවත් කෙරෙන බව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා පවසයි.
- හින්දු බලපෑම නිසා පොළොන්නරු යුගයේ සඳකඩපහණින් ගවයා ඉවත්ව ඇත.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.**
**කෙටි හැඳින්වීමක් තිබේනම් ලකුණු තුනක් දෙන්න.**
**(ලකුණු 03 යි.)**

**(iii) ශ්‍රී ලාංකේය කලාකරුවාගේ කලා කෞශල්‍යය බුද්ධ ප්‍රතිමා කලාව ඇසුරෙන් පහදන්න.**

- ශ්‍රී ලාංකේය කලා ශිල්පියා විවිධ මාධ්‍ය එනම් කළු ගල්, බදාම, දැව වර්ග, කිරිගරුඬ, ඇත් දළ, ලෝහ වර්ග ආදිය උපයෝගී කරගෙන විවිධ ඉරියව් පිළිබිඹු කරන ආකාරයෙන් බුද්ධ ප්‍රතිමා නිර්මාණය කොට ඇත.
- හිටි, හිඳි, ඔත් සහ සක්මන් විලාසය නිරූපණය කරන බුද්ධ ප්‍රතිමා ඒ අතර ප්‍රධාන වේ.
- බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාව, මහා ප්‍රඥාව ආදි ආධ්‍යාත්මික ගුණයන් නිරූපණය වන පරිදි ගණ වනාන්තරවල ඇති සිත් පිත් නැති කළු ගල්වල බුද්ධ ප්‍රතිමා නිර්මාණ කර ඇත.

- අවුකන, මාළිගාවිල, පොළොන්නරු ගල් විහාරය වැනි ස්ථානවල දක්නට ලැබෙන හිටි පිළිම වලින් ද තන්තිරිමලේ, පොළොන්නරු ගල් විහාරය වැනි ස්ථානවල ඇති ඔත් පිළිම වලින් හා අනුරාධපුරයේ සමාධි පිළිමය, තොළුවිල සමාධි පිළිමය, පොළොන්නරු ගල් විහාරයේ හිඳි පිළිමය, වැනි හිඳි පිළිම වලින් ද හෙළ කලාකරුවාගේ කලා කෞශල්‍යය මනාව ප්‍රකට කෙරේ.

- ප්‍රතිමා නිර්මාණයේ දී භාවිත කළ මුද්‍රා හා ආසන ප්‍රකට කරන්නේ ද හෙළ කලා කරුවාගේ අසහාය කලා කෞශල්‍යයයි.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.**
**(ලකුණු 05 යි.)**

**6. (i) පළමු ධර්ම සංගායනාවට තුඩුදුන් සුභද්‍ර භික්ෂුවගේ නොමනා ප්‍රකාශය ලියන්න.**

"ඇවැත්නි, නොහඬව්, නොවැලපෙව්, අපි ඒ මහා ශ්‍රමණයාගෙන් මැනෙවින් මිදුනෝ වෙමු."

" ඇවැත්නි, නොහඬන්න. සෝක නොකරන්න. අපි ඒ මහා ශ්‍රමණයාගෙන් මිදුනෙමු."

**මෙම අදහස ඇතුළත් පිළිතුරකට සම්පූර්ණ ලකුණු දෙන්න.**
**(ලකුණු 02යි.)**

**(ii) එම සංගායනාව පැවැත් වූ ස්ථානය, මූලිකත්වය ගෙන ක්‍රියා කළ මහරහතන් වහන්සේ සහ අනුග්‍රහය ලබාදුන් රාජ්‍ය පාලකයා නම් කරන්න.**

**පළමු සංගායනාව පැවැත් වූ ස්ථානය :** රජගහ නුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණී ගුහාද්වාරය අභියස/ රජගහ නුවර වේභාර පර්වතය පාමුල/ රජගහ නුවර සප්තපර්ණී ගුහද්වාරයේදී/ සප්තපර්ණී ගුහාද්වාරයේදී/ රජගහ නුවරදී

**මූලිකත්වය ගෙන ක්‍රියාකළ මහරහතන් වහන්සේ :** මහාකාශ්‍යප මහරහතන් වහන්සේ/ මහාකාශ්‍යප හිමි

**අනුග්‍රහය ලබා දුන් පාලකයා :** අජාසත්ත රජතුමා

**එක් කරුණකට ලකුණ බැගින් ලකුණු තුනක් දෙන්න.**

**(ලකුණු 03 යි.)**

**(iii) ධර්ම සංගායනාවන්හි ප්‍රධාන අරමුණ ශාසන සුරක්ෂිතතාව තහවුරු කිරීම බව පළමු සංගායනාව ඇසුරින් පහදන්න.**

- ධර්ම විනය දෙකෙහි අනාගත සුරක්ෂිතතාව ඇතිකරලීමේ අරමුණු පෙරදැරි කරගෙන ථේරවාදී සංගායනා පවත්වා ඇත. ධර්ම විනය දෙකට පටහැනි සාවද්‍ය කරුණු, දුර්මත ආදිය සංගායනාවකදී බැහැර කෙරේ.
- පළමුවන සංගායනාවේදී මේ සඳහා මූලික පියවර ගැනුණි. බුදුරජාණන් වහන්සේ අවුරුදු හතළිස් පහක් මුළුල්ලේ නොයෙක් ස්ථානයන්හිදී දේශනා කොට වදාළ විසිරී පැවතුනු ධර්මය විධිමත් ලෙස ගොනු කරනු ලැබුයේත්, ඒ ඒ ධර්ම කොටස් මුඛ පරම්පරාගතව රැකගෙන ඉදිරියට පවත්වාගෙන යාම සඳහා භාණක පරම්පරාවලට පවරනු ලැබුවේත්, මෙම ධර්ම සංගායනාවේදීය.
- සූත්‍ර පිටකය නිකාය පහකට ද විනය පිටකය කොටස් පහකට ද බෙදා මුඛ පරම්පරාගතව පවත්වාගෙන යාම සඳහා භාර කෙරුණි.

- එසේම සුභද්‍ර භික්ෂුව වැනි දුර්මතධාරී භික්ෂූන් නිහඬ කිරීම ද මෙම සංගායනාව මගින් සිදුවිය.
- කුඩා අනු කුඩා ශික්ෂාපද වෙනස් නොකොට ආරක්ෂා කිරීමට ගත් තීරණය ද ශාසන චිරස්ථිතිය සඳහා ඉවහල් විය.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.**
**(ලකුණු 05 යි.)**

**7. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට කෙටි සටහන් ලියන්න.**

(i) **දුටුගැමුණු මහරජතුමා**
(ii) **ත්‍රිලක්ෂණය**
(iii) **වීර්ය පාරමිතාව**
(iv) **මහනුවර යුගයේ චිත්‍ර කලාව**

## <u>දුටුගැමුණු රජතුමා</u>

රුහුණු රජ පෙළපතට අයත් කාවන්තිස්ස රජතුමාගේ හා විහාරමහා දේවියගේ වැඩිමහල් පුත්‍රයා ගාමිණී කුමාරයා ය. තිස්ස කුමාරයා ඔහුගේ සොහොයුරා විය. විදේශීය සතුරු බලවේගයන්ට නතුව පැවති අනුරාධපුර රාජධානිය ඉන් මුදවා ගැනීමේ දැඩි උනන්දුවක් ගැමුණු කුමාරයා සතුව පැවතුනි. තම පියරජතුමා සමග අමනාප වූ මොහු කාලයක් කොත්මලේ ප්‍රදේශයේ විසූ බව සඳහන් වේ. පිය රජතුමාගේ ඇවෑමෙන් රුහුණේ පාලකයා බවට පත් වූ මොහු මවගේත් භික්ෂූන් වහන්සේලාගේත් ආශීර්වාදයෙන් එළාර නම් සොළී පාලකයා සමග සටන් කොට සිරිලක එක්සේසත් කළේය. "මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවේ." යන ආදර්ශ පාඨය පෙරටු කරගෙන ක්‍රියාකළ මේ රජතුමා රුවන්වැලි මහා සෑය, මිරිසවැටි ස්තූපය, ලෝවාමහාප්‍රාසාදය හා තවත් වෙහෙර විහාර හැට අටක් ද, ආරෝග්‍ය ශාලා හා ගිලන් හල් ආදිය ද ඉදි කළේය. ලෝක ශාසනය කෙරෙහි අනුපමේය සේවයක් ඉටුකළ, ඉතා සැදැහැති දුටුගැමුණු රජතුමාගේ නාමය ශ්‍රී ලංකා ඉතිහාසයෙහි රන් අකුරින් ලියවී ඇත.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.**
**(ලකුණු 05යි.)**

## <u>ත්‍රිලක්ෂණය</u>

අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යනු ත්‍රිලක්ෂණයයි. අනිත්‍ය යනු වෙනස්වනසුලු බවයි. එනම් ලොව ඇති සියල්ල මොහොතින් මොහොත වෙනස්වන බව හෙවත් ස්ථිරසාර පැවැත්මක් නොමැති බවයි.
දුක්ඛ යනු දුක් සහිත බවයි. සැපදායකයයි සලකන සියලු වින්දනයන් තාවකාලිකය. එසේම අනිත්‍යය. ඒ නිසාම දුක් හට ගනී.
අනාත්ම යනු ආත්මයක් නොමැති බවයි. එනම් නිත්‍ය වූ, ස්ථිර වූ, නොවෙනස්ව පවතින ආත්මයක් නොමැත යන්නයි. සියල්ල අනිත්‍ය බවත්, ඒ නිසාම දුක් සහිත බවත්, අනිත්‍ය වූ දුක් සහිත වූ කිසිවක ආත්ම වශයෙන් ගත හැකි කිසිවක් නොමැති බවත් බුදු දහම අවධාරණය කරයි.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.**

**(ලකුණු 05යි.)**

## වීර්ය පාරමිතාව

දස පාර්මිතා ධර්ම අතර පස්වැන්න වීර්ය පාරමිතාව වේ. උතුම් බලාපොරොත්තුව ඉටු වන තෙක් නොපසුබට උත්සාහයෙන් කටයුතු කිරීම වීර්ය යි. තණ්හාවෙන්, මානයෙන් හා මිත්‍යා දෘෂ්ටියෙන් මිදී කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතුව තමන්ගේත් අනුන්ගේත් අභිවෘද්ධිය පිණිස ගන්නා බලවත් උත්සාහය වී වීර්ය පාරමිතාවයි. බෝසත් උතුමෝ තුන් ආකාරයකින් වීර්ය පාරමිතාව පූරණය කරති.

- බාහිර වස්තුවලට ආශාවෙන් අත් නොහරින වීර්ය
- ශරීරාංගවලට ආශාවෙන් අත්නොහරින වීර්ය
- ජීවිතයට ආශාවෙන් අත් නොහරින වීර්ය

යනාදි ත්‍රිවිධ අවස්ථාවන් පාරමී, උප පාරමී, පරමත්ථ පාරමී ලෙස දැක් වේ. අප මහ බෝසතාණන් වහන්සේ වීර්ය පාරමිතාව පූරණය කළ ආකාරය වණ්ණුපථ ජාතකයෙන් ප්‍රකට වේ.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.**
**(ලකුණු 05යි.)**

## මහනුවර යුගයේ චිත්‍ර කලාව

අනුරාධපුර හා පොළොන්නරු යුගවල පැවති චිත්‍ර සම්ප්‍රදායට වෙනස් වූ නව ශෛලියකින් නිර්මාණය වූ සිතුවම් කලාවක් මහනුවර යුගයේ දක්නට ලැබේ. මෙම යුගයේ චිත්‍ර ඇඳීම රේඛා කර්මය හා වර්ණ පූර්ණය යන අංශ දෙකින් යුක්තව සිදු කර ඇත. ඒ අනුව රූපවල බාහිර රේඛා ඇඳ අනතුරුව වර්ණ යොදා රූපය සම්පූර්ණ කිරීම සිදු වී ඇත. චිත්‍ර ඇඳීමේදී රතු, සුදු, කහ, කළු යන වර්ණ වැඩියෙනුත් නිල්, කොල වර්ණ අඩුවෙනුත් භාවිත කර ඇත.

සත්ත්ව, මිනිස් ආදී රූප හා ගස් වර්ග ස්වාභාවික ආකාරයෙන් ඇඳීම මේ යුගයේ සම්ප්‍රදාය නොවිය. දෙගල්දොරුව විහාරය, මැදවල විහාරය, රන්ගිරි දඹුලු විහාරය, බඹරගල විහාරය, කැළණියේ පැරණි විහාර මන්දිරය ආදී තැන්වල මේ යුගයට අයත් චිත්‍ර දක්නට ලැබේ. දෙවරගම්පොළ සිල්වත් තැන, හිරියාලෙ නයිදෙ, දේවේන්ද්‍ර මූලාචාරියා ආදීහු මේ යුගයට අයත් චිත්‍ර ශිල්පීහු වෙති. බුද්ධි ගෝචර නොවන දෘශ්‍ය ගෝචර රටාවකින් චිත්‍ර ඇඳීම මේ යුගයේ විශේෂ ලක්ෂණයකි.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.**
**(ලකුණු 05යි.)**